**2022.05.12 වන දින පෙ.ව. 09.30 ට හපුතලේ ප්‍රාදේශීය සභාවේ**
**නව සභා රැස්වීම් ශාලාවේදී පැවති**
**හපුතලේ ප්‍රාදේශීය සභා මාසික මහා සභා රැස්වීම් වාර්තාව**

**පැමිණීම**

1. බී. කන්දසාමි මහතා - ගරු සභාපති
2. වයි.එම්.නිමල් අමරසිරි මයා - ගරු උපසභාපති
3. සෙල්ලයියා සගාදේවන් මයා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
4. ආර්.එම්. ඉන්ද්‍රතිලක රාමනායක මයා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
5. සවරිමුත්තු ප්‍රභාහර් මයා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
6. මාරප්පන් කන්දසාමි මයා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
7. එච්.ඒ.ඩී. චාන්දනී මානෙල් කුමාරි මිය - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීණී
8. කේ.ඒ. චන්දන කිත්සිරි පෙරේරා මයා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
9. ඊ.එම්. සීගිරි ලංකා ඒකනායක මයා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
10. එල්.එච්. ඉන්දික සම්පත් මයා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
11. එෆ්. වයලට් රෝස් මහත්මිය - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීණී
12. ගෝපාලන් මුරුගන් මයා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
13. ඩි. සුදත් අරුණඅංජන මයා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
14. තංගවේලු මහේන්ද්‍රන් මයා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
15. ආර්.එම්. අනුලාවතී මල්ලිකා මිය - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීණී
16. එම්.ඒ. නිල්මිණී චන්ද්‍රකාන්ති මිය - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීණී
17. වේලුසාමී එලීල් අරසි මිය - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීණී
18. ආර්.එල්.සුදර්ශන මහතා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී

**01.පසුගිය රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම**

හපුතලේ ප්‍රාදේශීය සභාවේ 2022.04.07 වන දින පවත්වන ලද මාසික මහ සභාවෙ හි මහ සභා වාර්තාව කියවූවා සේ සළකා සභා සම්මත කිරීම සිදු කරන ලෙස ගරු මූලාසනය විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා උප සභාපති වයි.එම්. නිමල් අමරසිරි මහතා විසින් පසුගිය මහ සභා වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට යෝජනා කරන ලද අතර, එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. සුදත් අරුණ රංජන මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව පසුගිය මහ සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**02. සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය**
**අතිවිශේෂ**
**අංක 2272/42 – 2022 මාර්තු මස 24 වැනි බ්‍රහස්පතින්දා - 2022.03.24**

**පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ 10 අ (1)(අ) වගන්තිය යටතේ දැන්වීම.**
**හපුතලේ ප්‍රාදේශීය සභාව**

හපුතලේ ප්‍රාදේශීය සභාවේ සභිකයකු වන ගුරුගේ ලියෝ කැමිලස් ප්‍රනාන්දු මහතා එක්සත් ජාතික පක්ෂයේ සාමාජිකයකුව සිටීම අවසන් කර ඇති නිසා එම සභාවේ ඔහුගේ සභික ධූරය ගේ සභික ධූරය අතහැර ඇති බව, හපුතලේ ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි කේ. කාන්දීපන් වන මම (262 වැනි අධිකාරය වූ ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ 10 අ (1)(අ) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි.

කේ. කාන්දීපන් ,
තේරීම්භාර නිලධාරි,
හපුතලේ ප්‍රාදේශීය සභාව

02. DSP / 00170 / 2022
කොළඹ දිසා අධිකරණය - අංක 01
වැඩ බලන දිසා විනිසුරු පූර්ණිමා පරණගමගේ මැතිණිය ඉදිරිපිට පැමිණිල්ල වෙනුවෙන් කරන ලද ප්‍රකාශය

**03. සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී පී. වයලට් රෝස් මහත්මිය</u>

- තොටුලාගල වත්ත ශාන්ත අමලවුට්ප ක්‍රිස්තියානි දේවාලයේ ඉදිරිපස මිදුල ප්‍රතිසංස්කරණය කර දෙන ලෙස ට යොමු කර ඇති ලිපිය
- තොටුලාගල වතුකරයේ ඇති අඩු ආදායම්ලාභී පවුල් සඳහා හාල් ලබා දෙන ලෙසට යොමු කර ඇති ලිපිය

**04. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න.**

නැත

**05. යථා පරිදි කල් දී ඇති යෝජනා**

**යෝජනා අංක 01**

<u>ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා</u>

අංක 2199/29 දරණ 2020.10.29 දිනැති අයවැය සම්පාදනය බලාත්මක කිරීමේ රීති අංක 6(1) ඡේදය ප්‍රකාරව 2023 වර්ෂය අයවැය සම්පාදනය සඳහා වියදම් ඇස්තමේන්තු වෙත හා සංවර්ධන සැලැස්මට ඇතුළත් කළ යුතු යෝජනා මහජන නියෝජිතයන් නියෝජනය කරනු ලබන කොට්ඨාසයේ ප්‍රජාව සමඟ සාකච්ඡා කර අවශ්‍යයෙන් ම ඉටු කළ යුතු යෝජනා ඇත්නම් එකී යෝජනා 2022 - ජූනි මස 30 වන දිනට ප්‍රථම ලිඛිතව මා වෙත ලබා දෙන ලෙස යෝජනා කරන්නී ය.

<u>ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. සුදත් අරුණ රංජන මහතා</u>

<u>විවාද</u>

අංක 2199/29 දරණ 2020.10.29 දිනැති අයවැය සම්පාදනය බලාත්මක කිරීමේ රීති අංක 6(1) ඡේදය ප්‍රකාරව 2023 වර්ෂය අයවැය සම්පාදනය සඳහා වියදම් ඇස්තමේන්තු වෙත හා සංවර්ධන සැලැස්මට ඇතුළත් කළ යුතු යෝජනා මහජන නියෝජිතයන් නියෝජනය කරනු ලබන කොට්ඨාසයේ ප්‍රජාව සමඟ සාකච්ඡා කර අවශ්‍යයෙන් ම ඉටු කළ යුතු යෝජනා ඇත්නම් එකී යෝජනා 2022 - ජූනි මස 30 වන දිනට ප්‍රථම ලිඛිතව මා වෙත ලබා දෙන ලෙස ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## යෝජනා අංක 02

<u>ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා</u>

අංක 2199/29 දරණ 2020.10.29 දිනැති අයවැය සම්පාදනය බලාත්මක කිරීමේ රීති ප්‍රකාරව 6(1) ඡේදයේ සදහන් පරිදි වියදම් ඇස්තමේන්තුව හා සංවර්ධන සැලැස්මට ඇතුලත් කිරීමට අදහස් කරන යෝජනා 2022.06.30 ට පෙර ලබා දෙන ලෙස පුරවැසියන් දැනුවත් කරවීම සඳහා නිවේදනයක් භාෂා තුනෙන්ම 2022.05.31 දිනට පෙර පුවත්පත් වල පලකළ යුතු හෙයින් ඒ සදහා පුවතපත් දැන්වීම් සදහා වැයවන මුදල් සභා අරමුදලින් දැරීම හා එකී නිවේදනය මහ සභාවට යොමු කිරීම සුදුසු බව මූල්‍ය හා ප්‍රතිපත්ති කමිටුවෙ හි තීරණය කරන ලද බැවින් එකී තීරණය මහ සභාවට යෝජනා කරන්නී ය.

<u>ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. සුදත් අරුණ රංජන මහතා</u>

<u>විවාද</u>

අංක 2199/29 දරණ 2020.10.29 දිනැති අයවැය සම්පාදනය බලාත්මක කිරීමේ රීති ප්‍රකාරව 6(1) ඡේදයේ සදහන් පරිදි වියදම් ඇස්තමේන්තුව හා සංවර්ධන සැලැස්මට ඇතුලත් කිරීමට අදහස් කරන යෝජනා 2022.06.30 ට පෙර ලබා දෙන ලෙස පුරවැසියන් දැනුවත් කරවීම සඳහා නිවේදනයක් භාෂා තුනෙන්ම 2022.05.31 දිනට පෙර පුවත්පත් වල පලකළ යුතු හෙයින් ඒ සදහා පුවතපත් දැන්වීම් සදහා වැයවන මුදල් සභා අරමුදලින් දැරීම හා එකී නිවේදනය මහ සභාවට යොමු කිරීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## යෝජනා අංක 03

<u>ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා</u>

ප්‍රාදේශීය සභා පනතේ 133 වන වගන්තිය සමඟ කියවිය යුතු 2012 අංක 21 දරණ පළාත් පාලන ආයතන (විශේෂ විධි විධාන) පනතේ 16 වන වගන්තිය ප්‍රකාරව 2022 වර්ෂය සඳහා චෙක්පත් අත්සන් කිරීමේ දී දෙවන අත්සන්කරු වන ප්‍රධාන කළමණාකරණ සහකාර කේ.එම්.ජේ.ඩී. අනුර

බණ්ඩාර මහතාට අමතරව මුදල් සහකාර - ඒ.ජී. ආර්. ධර්මකීර්ති මහතා වෙත ද එකී බලය පැවරීම සුදුසු බව යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්. සුදර්ශන මහතා

විවාද

ප්‍රාදේශීය සභා පනතේ 133 වන වගන්තිය සමඟ කියවිය යුතු 2012 අංක 21 දරණ පළාත් පාලන ආයතන (විශේෂ විධි විධාන) පනතේ 16 වන වගන්තිය ප්‍රකාරව 2022 වර්ෂය සඳහා චෙක්පත් අත්සන් කිරීමේ දී දෙවන අත්සන්කරු වන ප්‍රධාන කළමණාකරණ සහකාර කේ.එම්.ජේ.ඩී. අනුර බණ්ඩාර මහතාට අමතරව මුදල් සහකාර - ඒ.ජී. ආර්. ධර්මකීර්ති මහතා වෙත ද එකී බලය පැවරීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකගතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකගතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 04**

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

දියතලාව නගර මධ්‍යයේ ඔසුසල ආසන්නයේද දැඩි වාහන තදබදයක් පවතින බැවින් ත්‍රීරෝද රථ ගාල වෙනත් ස්ථානයකට මාරු කිරීම පිළිබද තීරණයක් ලබා ගැනීම සුදුසු බව යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. සුදත් අරුණ රංජන මහතා

විවාද

දියතලාව නගර මධ්‍යයේ ඔසුසල ආසන්නයේද දැඩි වාහන තදබදයක් පවතින බැවින් ත්‍රීරෝද රථ ගාල වෙනත් ස්ථානයකට මාරු කිරීම පිළිබද තීරණයක් ලබා ගැනීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. සුදත් අරුණ රංජන මහතා අදහස් දක්වමින් ප්‍රමාණයෙන් විශාල රථයක් යහළබැද්ද මාර්ගයෙන් වට රවුමට පැමිණීමේ දී එම ස්ථානයේ ඇති ත්‍රී රෝද රථ ගාල හේතුවෙන් වාහන හැරවීම අපහසු බැවින් මෙම රථ ගාල වෙනත් ස්ථානයකට මාරු කිරීම සුදුසු බව පෙන්වා දෙන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. එම්. සීගිරි ලංකා ඒකනායක මහතා අදහස් දක්වමින් මෙම රථ ගාල මෙම ස්ථානයෙන් ඉවත් කර නැවත ස්ථාපිත කරන්නේ කුමන ස්ථානයේ ද යන්නත් සුදුසු ස්ථානයක් තීරණය නොකර එසේ ඉවත් කිරීමට තමා පෞද්ගලිකව විරුද්ධ බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්. සුදර්ශන මහතා අදහස් දක්වමින් රටේ වත්මන් ආර්ථික තත්ත්වය හමුවේ ප්‍රජාව දැඩි ආර්ථික අර්බුදයකට මුහුණ දී ඇති අවස්ථාවක මෙවැනි තීරණයක්

ගැනීම නුසුදුසු බවත් මෙවැනි තීරණයක් ගතහොත් දැඩි විරෝධතාවයක් එල්ල විය හැකි බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එච්. ඉංදික සම්පත් මහතා අදහස් දක්වමින් දැඩි ආර්ථික අර්බුදය හමුවේ මෙවැනි ක්‍රියා සිදු කිරීමෙන් ප්‍රජාව තව තවත් අසරණභාවයට පත් වන බවත් ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් එකී යෝජනාව සම්බන්ධයෙන් විවිධ මත පළ කළ බැවින් මෙම යෝජනාව පසුව සළකා බැලීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 05**

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

දියතලාව, ඇල්ල ගම ,පාසල් මාවත ලිපිනයේ පිහිටි සී.කේ. ඇන්ඩ් සන්ස් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනයේ ලේකම් විසින් සිදු කර ඇති ඉල්ලීමට අනුව එම සාමගම දියතලාව පොලීසිය අසල නව සති පොළ ඉදි කර ඇති භූමිය ඉන්ධන පිරවුම්හලක් ස්ථාපිත කිරීමට නිදහස් කර ගැනීම සඳහා විශාල පිරිවැයක් දැරූ බවත් ඒ අනුව එය ඉටු කර ගැනීමට නොහැකි වූ හෙයින් දියතලාව නගරයේ බස් නැවතුම්පොළ අසළ පිහිටා ඇති ඉඩම් කොටස එම ආයතනය වෙත ලබා දෙන ලෙස කර ඇති ඉල්ලීම අනුව ඒ සඳහා තීරණයක් ගැනීම සුදුසු බව යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්. සුදර්ශන මහතා

විවාද

දියතලාව, ඇල්ල ගම ,පාසල් මාවත ලිපිනයේ පිහිටි සී.කේ. ඇන්ඩ් සන්ස් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනයේ ලේකම් විසින් සිදු කර ඇති ඉල්ලීමට අනුව එම සාමගම දියතලාව පොලීසිය අසල නව සති පොළ ඉදි කර ඇති භූමිය ඉන්ධන පිරවුම්හලක් ස්ථාපිත කිරීමට නිදහස් කර ගැනීම සඳහා විශාල පිරිවැයක් දැරූ බවත් ඒ අනුව එය ඉටු කර ගැනීමට නොහැකි වූ හෙයින් දියතලාව නගරයේ බස් නැවතුම්පොළ අසළ පිහිටා ඇති ඉඩම් කොටස එම ආයතනය වෙත ලබා දෙන ලෙස කර ඇති ඉල්ලීම අනුව ඒ සඳහා තීරණයක් ගැනීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. සුදත් අරුණ රංජන මහතා අදහස් දක්වමින් මෙම සමාගම ලියාපදිංචි සමාගමක් ද යන්න විමසීම් කරන ලදී. එසේම දියතලාව නගරයේ බස් නැවතුම්පොළ අසළ පිහිටා ඇති ඉඩම් කොටස සම්බන්ධයෙන් සභාවට කිසිදු තීරණයක් ගත නොහැකි බවත් පැවරීම සඳහා මැනුම් කටයුතු මේ වන විට සිදු කර අවසන්ව ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. එම්. සීගිරි ලංකා ඒකනායක මහතා අදහස් දක්වමින් මෙය සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති සමාගමක් ද යන්නත් මෙවැනි වගකීම් විරහිත ලිපි සභාවට යොමු කිරීමෙන් වළකින ලෙසත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්. සුදර්ශන මහතා අදහස් දක්වමින් මෙකී යෝජනාව සභාපතිතුමන්ගේ යෝජනාවක් ලෙස ඉදිරිපත් කර ඇත්තේ කුමන පරමාර්ථයෙන් ද යන්නත් මෙම

ආයතනය විසින් ඉල්ලීම් කරනු ලබන්නේ දියතලාව නගරය තුළ පිහිටි ඉතාමත් වටිනාම බිම් කොටසක් බවත් මෙවැනි ආයතනවලින් කරනු ලබන ඉල්ලීම් සම්පූර්ණයෙන්ම වැරදි බවත් එවැනි ඉල්ලීම් සභාවට යෝජනාවක් ලෙස ඉදිරිපත් කිරීම වැරදිබවත් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් අදාල සමාගම විසින් අසාධාරණයට ලක් වූ බව පවසමින් ඒ සඳහා සාධාරණයක් ඉටුකර දෙන ලෙසට ප්‍රකාශ කළ අතර තමාහට පෞද්ගලිකව මේ සඳහා තීරණයක් ලබා ගත නොහැකි හෙයින් මෙය සභාවට යොමු කර ඒ හරහා තීරණයක් ගැනීම සුදුසු බැවින් මෙකී ගැටලුව සභාවට ඉදිරිපත් කළ බවත් අදාල පුද්ගලයා විසින්ම එකී අවස්ථාවේ දී සභාවට පැමිණීය හැකි ද යන්න විමසීම හේතුවෙන් එම අවස්ථාව ලබා දිය හැකි බව ප්‍රකාශ කළ බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. සුදත් අරුණ රංජන මහතා වැඩිදුරටත් අදහස් දක්වමින් අදාල සමාගම අසාධාරණයට ලක් වූ බවත් මෙවැනි ක්‍රියාමාර්ග ගැනීම එයට විසඳුමක් නොවන බවත් මෙවැනි යෝජනා සභාවට ඉදිරිපත් කිරීමේ දී අදාල පුද්ගලයන් සභාවට ගෙන්වා ගැනීමෙන් මින් පෙර අවස්ථාවක දීද ගැටලුවක් ඇති වූ බවත් ඒ හේතුවෙන් පෞද්ගලික අමනාපකම් ඇති වූ බැවින් මෙවැනි යෝජනා සභාවට ඉදිරිපත් නොකරන ලෙස ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකගතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් එකී යෝජනාව ප්‍රතික්ෂේප කළ හෙයින් සභා සම්මත නොවිය.

**යෝජනා අංක 06**

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

හපුතලේ ප්‍රාදේශීය සභාවේ ඝන අපද්‍රව්‍ය කළමණාකරණ මධ්‍යස්ථානය - විෂය භාර නිලධාරි වන කේ.ජී.ඒ. අයි.ඒ. කුමාර මහතා විසින් එකී කටයුතු අධීක්ෂණය සඳහා සතියකට දින 03ක් පමණ තම පෞද්ගලික යතුරු පැදිය භාවිතයෙන් එකී කටයුතු නිරීක්ෂණය සිදු කළ අතර වත්මන් ආර්ථික තත්ත්වය හමුවේ ඉන්ධන සඳහා විශාල පිරිවැයක් දැරීමට සිදු වන බැවින් එකී කටයුතු පෞද්ගලික වියදමින් සිදු කිරීම අපහසු හෙයින් ඝන අපද්‍රව්‍ය කළමණාකරණ මධ්‍යස්ථානය - විෂය භාරව කටයුතු කරනු ලබන නිලධාරියා වෙත මාසිකව පරිවර්ථිත ගමන් වියදම ලෙස රු. 2500/- ක මුදලක් ගෙවීම සුදුසු බව යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා උප සභාපති වයි.එම්. නිමල් අමරසිරි මහතා

විවාද

හපුතලේ ප්‍රාදේශීය සභාවේ ඝන අපද්‍රව්‍ය කළමණාකරණ මධ්‍යස්ථානය - විෂය භාර නිලධාරි වන කේ.ජී.ඒ. අයි.ඒ. කුමාර මහතා විසින් එකී කටයුතු අධීක්ෂණය සඳහා සතියකට දින 03ක් පමණ තම පෞද්ගලික යතුරු පැදිය භාවිතයෙන් එකී කටයුතු නිරීක්ෂණය සිදු කළ අතර වත්මන් ආර්ථික තත්ත්වය හමුවේ ඉන්ධන සඳහා විශාල පිරිවැයක් දැරීමට සිදු වන බැවින් එකී කටයුතු පෞද්ගලික වියදමින් සිදු කිරීම අපහසු හෙයින් ඝන අපද්‍රව්‍ය කළමණාකරණ මධ්‍යස්ථානය - විෂය භාරව කටයුතු කරනු ලබන නිලධාරියා වෙත මාසිකව පරිවර්ථිත ගමන් වියදම ලෙස රු. 2500/- ක මුදලක් ගෙවීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 07**

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

හපුතලේ ප්‍රාදේශීය සභාවට අයත් බිම් කොටසෙ හි පවත්වාගෙන යනු ලබන ධීවර සංස්ථාව පිහිටි භූමියෙ හි බදු ගිවිසුම් කාලය 2022 මැයි මස 31 වන දිනෙන් අවසන් වන බැවින් නැවත වසර 03ක් සඳහා බදු ගිවිසුම් කාලය දීර්ඝ කිරීම ද මාසික බදු මුදල රු.6,000.00 ලෙස තීරණය කිරීම සුදුසු බව යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා උප සභාපති වයි.එම්. නිමල් අමරසිරි මහතා

විවාද

හපුතලේ ප්‍රාදේශීය සභාවට අයත් බිම් කොටසෙ හි පවත්වාගෙන යනු ලබන ධීවර සංස්ථාව පිහිටි භූමියෙ හි බදු ගිවිසුම් කාලය 2022 මැයි මස 31 වන දිනෙන් අවසන් වන බැවින් නැවත වසර 03ක් සඳහා බදු ගිවිසුම් කාලය දීර්ඝ කිරීම ද මාසික බදු මුදල රු.6,000.00 ලෙස තීරණය කිරීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 08**

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

හපුතලේ ප්‍රාදේශීය සභාව සඳහා අවශ්‍ය අතුරු ව්‍යවස්ථා සම්පාදනය කිරීම සුවිශේෂී කාර්යයක් වන අතර ඒ සඳහා දරනු ලබන ප්‍රයත්නය හා එකී වගකීම් පිළිබඳ සළකා බලා එකී කමිටුව වෙත කමිටු දීමනාවක් ගෙවීම සුදුසු බවත් ඒ සඳහා රු..1000.00ක මුදලක් එක් කමිටු සාමාජිකයකු වෙත ගෙවීම සුදුසු බවත් යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්. සුදර්ශන මහතා

විවාද

හපුතලේ ප්‍රාදේශීය සභාව සඳහා අවශ්‍ය අතුරු ව්‍යවස්ථා සම්පාදනය කිරීම සුවිශේෂී කාර්යයක් වන අතර ඒ සඳහා දරනු ලබන ප්‍රයත්නය හා එකී වගකීම් පිළිබඳ සළකා බලා එකී කමිටුව වෙත කමිටු දීමනාවක් ගෙවීම සුදුසු බවත් ඒ සඳහා රු..1000.00ක මුදලක් එක් කමිටු සාමාජිකයකු වෙත ගෙවීම සුදුසු බවත් ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 09**

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

හපුතලේ ප්‍රාදේශීය සභාවේ ආබාධිත පුද්ගලයින් , කාන්තා මූලික පුද්ගලයින් , රැකියා විරහිත තරුණයින්, වැඩිහිටි ප්‍රජාව , හඳුනා ගත් සහ ප්‍රමුඛතා රහිත වරප්‍රසාද රහිත කණ්ඩායම්වල සාමාජිකයන් හා බල ප්‍රදේශයේ සමිති සමාගම් වෙත මූල්‍ය ප්‍රතිපාදන හා ද්‍රව්‍යාධාර සැපයීම සඳහා අභ්‍යන්තර ප්‍රතිපත්තියක් සැකසීම සඳහා සකස් කරන ලද කමිටුව (මහ සභාව) විසින් සකසන ලද ඇමුණුමේ සඳහන්

I. හපුතලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ප්‍රජා අවශ්‍යතා සැලසීම අරමුණු කර ගෙන කොට්ඨාස මට්ටමෙන් අවධානමට ලක් වූ ප්‍රජාව , ආබාධිත පුද්ගලයින් සඳහා මූල්‍ය ප්‍රතිපාදන සැලසීම සඳහා වන අභ්‍යන්තර ප්‍රතිපත්තිය
II. හපුතලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි කොට්ඨාස මට්ටමෙන් පවතින විවිධ ප්‍රජා සංවිධාන , කාන්තා සංවිධාන , තරුණ සංවිධාන , ආගමික සංවිධාන සඳහා මූල්‍ය ප්‍රතිපාදන හා ද්‍රව්‍යාධාර සැපයීම සඳහා වන අභ්‍යන්තර ප්‍රතිපත්තිය
III. හපුතලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ අවධානමට ලක් වූ ප්‍රජාව සඳහා සභා අරමුදලෙන් මූල්‍ය ප්‍රතිපාදන වෙන් කිරීම සඳහා වන අභ්‍යන්තර ප්‍රතිපත්තිය සකසා 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ විධිවිධානයන් ට යටත්ව මහ සභාවේ සභා සම්මත කර ඌව පළාත් පළාත් පාලන කොමසාරිස්වරයාගේ හා ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යොමු කර ක්‍රියාත්මක කිරීම සුදුසු බව යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්. සුදර්ශන මහතා

විවාදය

හපුතලේ ප්‍රාදේශීය සභාවේ ආබාධිත පුද්ගලයින් , කාන්තා මූලික පුද්ගලයින් , රැකියා විරහිත තරුණයින්, වැඩිහිටි ප්‍රජාව , හඳුනා ගත් සහ ප්‍රමුඛතා රහිත වරප්‍රසාද රහිත කණ්ඩායම්වල සාමාජිකයන් හා බල ප්‍රදේශයේ සමිති සමාගම් වෙත මූල්‍ය ප්‍රතිපාදන හා ද්‍රව්‍යාධාර සැපයීම සඳහා අභ්‍යන්තර ප්‍රතිපත්තියක් සැකසීම සඳහා සකස් කරන ලද කමිටුව (මහ සභාව) විසින් සකසන ලද ඇමුණුමේ සඳහන්

I. හපුතලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ප්‍රජා අවශ්‍යතා සැලසීම අරමුණු කර ගෙන කොට්ඨාස මට්ටමෙන් අවධානමට ලක් වූ ප්‍රජාව ,

ආබාධිත පුද්ගලයින් සඳහා මූල්‍ය ප්‍රතිපාදන සැලසීම සඳහා වන අභ්‍යන්තර ප්‍රතිපත්තිය

II. හපුතලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි කොට්ඨාස මට්ටමෙන් පවතින විවිධ ප්‍රජා සංවිධාන , කාන්තා සංවිධාන , තරුණ සංවිධාන , ආගමික සංවිධාන සඳහා මූල්‍ය ප්‍රතිපාදන හා ද්‍රව්‍යාධාර සැපයීම සඳහා වන අභ්‍යන්තර ප්‍රතිපත්තිය

III. හපුතලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ අවධානමට ලක් වූ ප්‍රජාව සඳහා සභා අරමුදලෙන් මූල්‍ය ප්‍රතිපාදන වෙන් කිරීම සඳහා වන අභ්‍යන්තර ප්‍රතිපත්තිය සකසා 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ විධිවිධානයන් ට යටත්ව මහ සභාවේ සභා සම්මත කර ඌව පළාත් පළාත් පාලන කොමසාරිස්වරයාගේ හා ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යොමු කර ක්‍රියාත්මක කිරීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 10**

<u>ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා</u>

2022 ජූනි මස මහ සභාව පැවැත්වෙන දිනය තීරණය කිරීම සුදුසු බව යෝජනා කරන්නී ය.

<u>ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්. සුදර්ශන මහතා</u>

<u>විවාද</u>

2022 ජූනි මස මහ සභාව පැවැත්වෙන දිනය ලෙස 2022 ජූනි මස 09 වන බ්‍රහස්පතින්දා දිනය තීරණය කිරීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 06. කාරක සභා වර්තාව

2022.05.04 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තා සභාව වෙත ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා ගරු සභාවේ එකඟතාවය ලැබිණි.

## 07. ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ

2022 අප්‍රේල් මස ලැබීම් හා වියදම් පිළිබඳ මාසික වාර්තාව සභාව වෙත ඉදිරිපත් කරන ලද අතර, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්. සුදර්ශන මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී. මහේන්ද්‍රන්

මහතා සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.සුදත් අරුණ රංජන මහතා මේ සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කළ අතර 2022 අප්‍රේල් මස ලැබීම් හා වියදම් පිළිබඳ මාසික වාර්තාව සඳහා ගරු සභාවේ එකඟතාවය ලැබිණි.

**08.වෙනත් කරුණු**

**08.1 ගරු මන්ත්‍රීවරුන්ගේ නිවාඩු**

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.එම්. විමලසිරි මහතා අසනීප නිවාඩු ලබා ඇති බැවින් 2022-05-12 වන දින සභාවට සහභාගී නොවීම සම්බන්ධයෙන් ගරු සභාව විසින් එකී සභිකයන් හට අසනීප නිවාඩු ලබා දීම සුදුසු බවට එකඟතාවය පළ කරන ලදී.

**<u>08.2 ගරු මන්ත්‍රීවරුන්ගේ අදහස් දැක්වීම.</u>**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී. මහේන්ද්‍රන් මහතා අදහස් දක්වමින් පසුගිය මහා සභා යෝජනා වාරයේ දී ගරු සභික මණ්ඩලය වෙත මහා සභා වාර්තා බෙදා හැරීමේ දී න්‍යාය පත්‍රය හා කැඳවීමේ ලිපිය පමණක් ලබා දෙන ලෙසට තමා විසින් යෝජනා කරනු ලැබූවද මෙවර සභා වාර්තා අවශ්‍ය අනෙකුත් ලිපි ලේඛන සියල්ලම ලැබී ඇති බවත් ප්‍රකාශ කරන ලදී.මේ සම්බන්ධයෙන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.සුදත් අරුණ රංජන මහතා මෙන්ම ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්. සුදර්ශන මහතා ද අදහස් දක්වමින් මෙය නීත්‍යානුකූල ලියවිල්ලක් බැවින් හැකි නම් මුද්‍රිත මාධ්‍ය යොදා සභා වාර්තාව ලබා දෙන ලෙස ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් ලිපි ද්‍රව්‍ය ප්‍රමාණවත් නම් මින් පෙර අවස්ථාවන් හි සිදු කළ පරිදි සභා වාර්තා මුද්‍රිත මාධ්‍ය යොදා ගනිමින් යැවීමට ඉදිරියේ දි කටයුතු සිදු කරන බව ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්. සුදර්ශන මහතා අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. ලියෝ කැමිලස් ප්‍රනාන්දු මහතා ගේ සභික ධූරය තාවකාලිකව අත්හිටුවීම සම්බන්ධයෙන් තම කණගාටුව ප්‍රථමයෙන්ම ප්‍රකාශ කරන බව සඳහන් කරන අතර ප්‍රජාව විසින් මේ වන විට මුහුණ දී ඇති ආර්ථික ගැටලුකාරී බව සම්බන්ධයෙන් මාසයක් වැනි කාලයක් තුළ කිසිම කලහකාරි බවකින් තොරව ගාලු මුවදොර පිටියේ පවත්වාගෙන ගිය සාමකාමී අරගලය සඳහා ප්‍රහාරයක් එල්ල කළ බවත් එය හෙළා දකින බවත් අරගලය හේතුවෙන් මේ වන විට විශාල ජයග්‍රහණ ප්‍රමාණයක් අත්පත් කර ගෙන ඇති බවත් , හපුතලේ ප්‍රාදේශීය සභාවේ ගරු මන්ත්‍රීවරුන් ගෝල්ෆේස් පිටියේ පැවති කලහකාරී අවස්ථාවට සහභාගි නොවීම සම්බන්ධයෙන් තමා ස්තූතිවන්ත වන බවත් ප්‍රකාශ කළ අතර අද දින කලු පටි පැළඳ සභාවට සහභාගි වීම හේතුවෙන් ඒ සඳහා විරෝධය ප්‍රකාශ කරන බවත් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

මෙදින සභා රැස්වීම ප.ව.12.00ට අවසන් විය.

**<u>සංශෝධන</u>**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. සුදත් අරුණ රංජන මහතා යෝජනා අංක 05 යටතේ දක්වන ලද අදහස් යටතේ දියතලාව නගරයේ බස් නැවතුම්පොළ අසළ පිහිටා ඇති ඉඩම් කොටස **වෙනත්**

**අයෙකුට පැවරීම** සම්බන්ධයෙන් සභාවට කිසිදු තීරණයක් ගත නොහැකි බවත් **සභාව වෙත පැවරීම** සඳහා මැනුම් කටයුතු මේ වන විට සිදු කර අවසන්ව ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

බී. කන්දසාමි,
සභාපති,
හපුතලේ ප්‍රාදේශීය සභාව,
දියතලාව.